# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1985 අංක 18 දරන වැන්දඹු සහ අනන්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය (සන්නද්ධ හමුදා) (සංශෝධන පනත)

---

[සහතිකය සටහන් කළේ 1985 මැයි මස 10 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1985 මැයි මස 10 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිල : ශත 45 යි | තැපැල් ගාස්තුව : ශත 60යි

**1985 අංක 18 දරන වැන්දඹු සහ අනාථ දරු විශ්‍රාම වැටුප් ක්‍රමය (සන්නද්ධ හමුදා) (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 1985 මැයි මස 10 වන දින.]

එල්. ඩී.—ඕ. 27/84

**1970 අංක 18 දරන වැන්දඹු සහ අනාථ දරු විශ්‍රාම වැටුප් ක්‍රමය (සන්නද්ධ හමුදා) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1985 අංක 18 දරන වැන්දඹු සහ අනාථ දරු විශ්‍රාම වැටුප් ක්‍රමය (සන්නද්ධ හමුදා) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

**2.** 1970 අංක 18 දරන වැන්දඹු සහ අනාථ දරු විශ්‍රාම වැටුප් ක්‍රමය (සන්නද්ධ හමුදා) පනතේ 3 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය එහි 3අ වගන්තිය වශයෙන් බලසහිත විය යුතු ය :— — 1970 අංක 18 දරන පනතේ 3අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

" සේවයෙහි නොකඩවා සිටින හෝ විශ්‍රාම ලැබූ හෝ මියගිය සාමාජිකයන් ඇතුළත් කිරීමට විශ්‍රාම වැටුප් ක්‍රමය ව්‍යාප්ත කිරීම.

3අ. (1) 1968 සැප්තැම්බර් මස 30 වන දින හෝ ඉන් පෙර සන්නද්ධ හමුදාවල සාමාජිකයකු වූ සහ එකී දිනයට පසු එවැනි සාමාජිකයකු වශයෙන් නොකඩවා සේවය කරන්නා වූ හෝ ඉන් අනතුරුව විශ්‍රාම ලැබුවා වූ ද නියෝගවලට අනුකූලව පිහිටුවනු ලැබූ විශ්‍රාම වැටුප් ක්‍රමයට දායකයකු නොවීමට 3 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ තීරණය කළා වූ ද යම් තැනැත්තකු විසින් මේ වගන්තිය ක්‍රියාත්මක වීමේ දින සිට අවුරුදු දෙකක කාලයක් ඇතුළත එකී විශ්‍රාම වැටුප් ක්‍රමයට දායකයකු වීමට තීරණය කරනු ලැබිය හැකි ය :

එසේ වුවද, ඉහත සඳහන් අවස්ථානුගත කරුණු අනුව සන්නද්ධ හමුදාවල සාමාජිකයකු වූ යම් තැනැත්තකු මේ වගන්තිය ක්‍රියාත්මක වීමේ දිනයට පෙරාතුව මියගිය අවස්ථාවක හෝ මේ උප වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ තීරණයක් කිරීමට පෙර මිය යන අවස්ථාවක ඒ තැනැත්තා භාර්යාවක හෝ දරුවකු, හෝ භාර්යාවක සහ දරුවකු, හෝ භාර්යාවක සහ දරුවන් සිටිය දී මියගිය හොත් ඔහු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායකයකු වීමට තීරණය කළ බවට සලකනු ලැබිය යුතු ය.

(2) විශ්‍රාම වැටුප් ක්‍රමයට දායකයකු වීමට තීරණය කරන යම් තැනැත්තකු විසින් හෝ විශ්‍රාම වැටුප් ක්‍රමයේ දායකයන් වීමට තීරණය කළේ යයි සලකනු ලබන තැනැත්තන් සම්බන්ධයෙන් වන විට ඒ මියගිය තැනැත්තාගේ කටයුතු අද්මිනිස්ත්‍රාසි කරන තැනැත්තා විසින්, 1968 ඔක්තෝබර් මස 1 වන දිනයෙන් ආරම්භ වන සහ අවස්ථාවෝචිත පරිදි, තීරණය කිරීමේ, විශ්‍රාම ගැනීමේ හෝ මරණය සිදුවීමේ දිනය තෙක්

වන කාලය සඳහා සියලු හිඟ දායක මුදල් සහ ඒ මත වර්ෂයකට සියයට හතරක අනුප්‍රමාණය අනුව පොලිය විශ්‍රාම වැටුප් ක්‍රමයට ගෙවිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ වූ විධි විධාන යටතේ කරන ලද තීරණයක් අවසානාත්මක විය යුතු ය.

(4) මේ පනතේ 3 වන වගන්තියෙහි පටහැනිව කුමක් සඳහන්ව ඇත ද මේ වගන්තියේ විධි විධාන බලපැවැත්විය යුතු ය.".

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිළ (දේශිය) රු. 150 කි. (විදේශිය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා, පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.